# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 207 /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2024

දිනය / திகதி / Date – 05/02/2024 පැය 1150

## මාධ්‍ය නිවේදනය

**<u>පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධව</u>**

**01. 2024.02.04 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරින් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 02 | 02 | 67 | 648 | ගෑස් ලිප් 01<br>යතුරු පැදි 01<br>ගෑස් සිලින්ඩර් |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථාන වෙත ඉදිරිපත් කර ඇත.

**02. මත්කරල් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා සෙට්ටිකුලම කඳවුර.**

2024.02.04 වන දින දහවල් කාලයේ මිහින්තලේ පොලිස් වසමේ රඹෑව ප්‍රදේශයේ දී පොලිස් විශේෂ කාර්ය බලකා සෙට්ටිකුලම කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර මත්කරල් 50 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මිහින්තලේ පොලිස් ස්ථානයට භාරදී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 27 ක් වූ අනුරාධපුරය ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ. මිහින්තලේ පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**03. මත්කරල් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා සෙට්ටිකුලම කඳවුර.**

2024.02.04 වන දින දහවල් කාලයේ මිහින්තලේ පොලිස් වසමේ රඹෑව ප්‍රදේශයේ දී පොලිස් විශේෂ කාර්ය බලකා සෙට්ටිකුලම කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර මත්කරල් 20 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මිහින්තලේ පොලිස් ස්ථානයට භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 21 ක් වූ අනුරාධපුරය ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ. මිහින්තලේ පොලිසිය** වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි

## 04. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා හපුතලේ කඳවුර

2024.02.04 වන දින සවස් කාලයේ හල්දුම්මුල්ල පොලිස් වසමේ හල්දුම්මුල්ල ප්‍රදේශයේ දී පොලිස් විශේෂ කාර්ය බලකා හපුතලේ කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන හල්දුම්මුල්ල පොලිස් ස්ථානයට භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 29 ක් වූ හල්දුම්මුල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ. හල්දුම්මුල්ල** පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

## 05. රක්ෂිත ප්‍රදේශයකට අනවසරයෙන් යාත්‍රාවක් ඇතුළු කළ සැකකරුවන් සිව්දෙනකු මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කන්තලේ කඳවුර

2024.02.04 වන දින සවස් කාලයේ සූරියපුර පොලිස් වසමේ සෝමාවතිට ජාතික උද්‍යාන ප්‍රදේශයේ දී පොලිස් විශේෂ කාර්ය බලකා කන්තලේ කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ ඉහත රක්ෂිත ප්‍රදේශයට යාත්‍රාවක් ඇතුළු කළ පුද්ගලයින් සිව්දෙනෙකු අත්අඩංගුවට ගන වන ජීවී ආරක්ෂක දෙපාර්තමේන්තුවේ කන්තලේ වන ජීවී අඩවි ආරක්ෂ නිලධාරී වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 21 ත් 39 ත් වයස් වල පසුවන මූතූර් ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

.

## 06. බලපත්‍රයක් නොමැතිව තේක්ක දැව කඳන් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා අරන්තලාව කඳවුර

2024.02.04 වන දින රාත්‍රී කාලයේ මහඔය පොලිස් වසමේ පලතුරුවැල්ල දේශයේ දී පොලිස් විශේෂ කාර්ය බලකා කන්තලේ කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර බලපත්‍ර නොමැතිව තේක්ක දැව කඳන් 34 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මහඔය අඩවි වන කාර්යාලය වෙත භාර දී ඇත.

**අඩංගුවට ගත් සැකකරු 30 ක් වූ සේරංකඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**